**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2018**
**--------------------------------------------------**

**1.1 මතය**
**-------**

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ((1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වෛද්‍ය ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමණාකාරීත්වය වෛද්‍ය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂයපථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෛද්‍ය ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී

පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, වෛද්‍ය ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.14,709,918ක ගිණුම් ශේෂයෙන් රු.9,961,937 ක ශේෂයක් දින 650ට වඩා පැරණි බව නිරීක්ෂණය වූ අතර, එය මුළු ලැබිය යුතු ශේෂයෙන් සියයට 67.72 ක් විය. එසේම 2018 දෙසැම්බර් 31 දිනට පෞද්ගලික බස් සමාගමකින් රු.742,312 ක මුදලක් වසර 3කට වැඩි කාලයක සිට අය නොවී පවතින අතර, එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙට්‍රෝ පොලිටන් නමින් බස් සමාගමක් මේ වන විට ක්‍රියාත්මක නොවන **බැවින් ඒ පිළිබඳව** ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩල සභාපතිතුමා වෙත ලිපි යොමු **කර ඇත** | හිග ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.33,588,765 ක මුදලින් රු.6,990,722 ක මුදලක් හෙවත් සියයට 21 ක ප්‍රතිශතයක් දින 650ට වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. | 2019 වර්ෂයේදී රු. 9,428,298 ක් ගෙවා ඇති අතර, ඉතිරි මුදල් ගෙවීම සඳහා කටයුතු කරනු ලැබේ. | පැරණි ශේෂයන් කඩිනමින් නිරවුල් හෝ තවදුරටත් ගෙවීමට වගකීමක් නොවේ නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 06 වගන්තිය | වෛද්‍ය පරීක්ෂණ සඳහා භාවිතාකර ඉවත් කරන ඉඳිකටු, පුළුන් යනාදී රසායනාගාර උපකරණ හා අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර, ඒවා ආයතන භූමිය තුල පරිසරයට හානිවන පරිදි රැස්කර තිබුණි. | එම ඉවත ලන ද්‍රව්‍ය ලබා ගන්නා ස්ථානයක් පිළිබද සොයාබලා ඒ අනුව කටයුතු කිරීමට නියමිතය. මේ පිළිබද රජයේ අංශ වලින් විමසීම් කර ඇත. | අපද්‍රව්‍ය ඉවත් කිරීම නිවැරදි ක්‍රමවේද අනුව සිදු කල යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි02 දිනැති පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් ස්ථාවර තැන්පතු , භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල මුදල් ආයෝජනය කර තිබුණු අතර, 2018 දෙසැම්බර් 31 දිනට රු.857,072,581 ක ශේෂයක් විය. | පිළිතුරු ලැබී නොමැත. | අදාල අනුමැතියන් ලබා ගත යුතුය. |
| (ඇ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | සමීක්ෂණ වාර්තාව අදාල අංශ වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. | නියමිත කාල සීමාව තුල සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කල යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2000 ජනවාරි 11 දිනැති අංක: පිඑෆ්/පිර් 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව ආයතනයේ සේවකයන් සඳහා රු.41,687,959 ක් පැමිණීමේ දීමනා වශයෙන් ගෙවා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබා ගෙන ඇත. | අදාල අනුමැතීන් ලබාගත යුතුවීම. |
| (ඉ) | 2015 සැප්තැම්බර් 25 දිනැති අංක එස්බි/02/01 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2018 වර්ෂයේ දෙසැම්බර් 24 දින සේවක සුහද හමුව මහනුවර දිස්ත්‍රික්කයේ හෝටලයක පැවැත්වීම වෙනුවෙන් රු.2,546,685 ක වැයක් දරා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමට කළමනාකරණය වගබලාගත යුතුය. |
| (ඊ) | අංක:පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | ආයතනය සේවකයින්ගේ සුහසාධනය සඳහා මගී සේවා අවසර පත්‍ර ලබාදීමට කටයුතු කර තිබුණු අතර වර්ෂය තුලදී ඒ සඳහා රු.9,428,298 ක වියදම් දරා තිබුණු අතර, ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන ඇත. | මෙකී වියදම් කිරීම අදාල ආයතන වලින් නිසි අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු339,605,034 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.236,394,046 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.103,210,988 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ වෛද්‍ය සහතික සේවා ආදායම රු.126,606,687 කින් හා ආයෝජන පොලී ආදායම රු.3,531,217 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් අනුරාධපුර හා නුවර ශාඛා කාර්යාල සඳහා ගොඩනැගිල්ල බැගින් ඉදිකිරීමට 2018 ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම්කර තිබුණද, අවශ්‍ය අනුමැතිය ලබා නොගැනීම නිසා එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු 2019 අප්‍රේල් මස වන විටද, ආරම්භ කර නොතිබුණි. එම හේතුවෙන් දැනට මෙම කාර්යාල කුලී පදනම යටතේ ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යන අතර, වර්ෂය තුලදී අනුරාධපුර ශාඛා කාර්යාලය සඳහා රු.696,875 ක් ද, නුවර ශාඛා කාර්යාලය සඳහා රු. 1,096,500 ක්ද, කුලී මුදල් ලෙස ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත. | ක්‍රියාකාරි සැලැස්මේ අනුකූල කාර්යය පමණක් සීමා නොකර එම කාර්යයන් ඉටු කිරීමට ක්‍රියා කළ යුතුවීම. |
| (ආ) | රජයේ නිලධාරින්ට ලබාදෙනු ලබන විශේෂ අත්තිකාරම් මුදල රු. 4000ක් වුවත් අධ්‍යක්ෂක මණ්ඩල තීරණය මත එම මුදල ඉක්මවා රු.25,000ක් දක්වා වැඩිකර වර්ෂය තුළදී නිලධාරින් වෙත රු.852,830 ක් විශේෂ අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. මෙලෙස වැඩිපුර ගෙවීම් සඳහා ආයතනය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගත යුතු වුවත්, එසේ ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබා ගෙන ඇත. | මේ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | ආයතනය විසින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ වාරික 10 කින් අයකර ගැනීමේ පදනම මත නිලධාරින් වෙත රු.30,000ක උත්සව අත්තිකාරම් ලබාදීමට අනුමැතිය ලබාදී වර්ෂය තුලදී රු.5,340,500 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. රු.30,000ක් උත්සව අත්තිකාරම් ලෙස ලබාදීම රජයේ පවත්නා විධිවිධාන වලට අනුකුල නොවන බැවින්, එලෙස ගෙවීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක් ලබාගෙන ඇත | රජයෙන් අනුමත කර ඇති ප්‍රමාණය ඉක්මවා ගෙවීම් සිදු කිරීමට නම් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 වන වගන්තිය අනුව ඉටුකල යුතු කාර්යයන් එනම්, ආයතනය විසින් කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා හා ආධාර සැලසීම, ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබාදීම, ආයතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සියලුම දිස්ත්‍රික්කවල සුදුසු වෛද්‍ය නිලධාරි මණ්ඩලයක් පත්කිරීම, කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම, සියලු වර්ග වලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හෝ මානසික යෝග්‍ය හා ප්‍රවීන තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවන ලබන බවට ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජිතායතන විමසා හෝ වගබලා ගැනීම හා අදාල ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු, ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිත සකස් කිරීම සහ සීමා නියම කිරීම යන කාර්යයන් ආයතනය විසින් ඉටුකර නොතිබුණි. | කෙසේ වෙතත් පනතේ තිබූ කාර්යයන් ඇතැම් අවස්ථාවන් වලදී පිහිටවූ මාර්ග ආරක්ෂක පනත වැනි පනත් මගින් කාර්යයන් බෙදිගොස් ඇති බැවින් ඉන් අනතුරුව පනත සංශෝධනය කරන අවස්ථාවකදී එම කාර්යයන් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනය මඟින් ඉටුකළ යුතු බවට පනතේ දක්වා ඇති කාර්යයන් ඉටු කිරීමට/ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි දෙවන මහල අලුත්වැඩියා කිරීම සඳහා වූ අදියර 01 හි ඉදිකිරීම්වල ඉතිරිය වූ රු.5,319,926 ක් එනම් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 13 ක මුදල යොදවා මූලික ඇස්තමේන්තුවට ඇතුලත් නොවූ රු.4,923,737 අතිරේක වැඩ ඉටුකර තිබුණි. | අවශ්‍යතාවය මත අමතර වැඩ කොටස් සිදු කර ඇත. | මූලික ඇස්තමේන්තුවට ඇතුලත් නො අතිරේක වැඩ ඉටුකිරීම වෙනුවට අනුමැතිය ලබාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොඩනැගිල්ල නවීකරණයේ 02 වන අදියරෙහි ඉදිකිරීම් වැඩ සඳහා ලංසු කැඳවීමකින් තොරව ඉහත කොන්ත්‍රාත්කරු වෙතම 2019 ජනවාරි 21 වන දින විට වැඩ නිම කිරීමේ පදනම මත රු.43,923,641 ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණද,2019 අප්‍රේල් 30 වන දින තෙක් ගිවිසගත් වැඩ අවසන් කර නොතිබුණි. එසේ වුවත් කොන්ත්‍රාත්කරගෙන් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ මෙතෙක් කළ වැඩ සඳහා ගෙවීම් කිරීමේදී වැට් බදු සමග රු.807,848 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එසේම ඇස්තමේන්තුගත පිරිවැය රු.1,448,776 ක් වූ අයිතම 4ක් ගිවිසුමට අනුව හා එකග වූ පිරිවිතර වලට අනුව යෙදවිය යුතු ඉදිකිරීම් ද්‍රව්‍ය යොදා නිමකර නොතිබුණු අතර, ඒ සඳහා උපදේශක අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | වැඩ නිම විය යුතු කාලරාමුව පිළිබඳව නවීකරණ කටයුතු සම්බන්ධයෙන් පැවති රැස්වීම්වලදී එකඟත්වයකට පත්වී ඇත. ප්‍රමාදවීම් ගාස්තු අය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයු කල යුතු වීම. |
| (ඇ) | ආයතනයේ දෙවන මහළ නවීකරන කටයුතු සඳහා 2017 වර්ෂයට පෙර රු.4,639,631 ක වියදමක් දරා තිබුණි. නැවත 2017 වර්ෂය තුලදී ගොඩනැගිලි නවීකරණය කටයුතු ඉටු කිරීම සඳහා නව කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමෙන් ඒ සඳහා රු.46,348,295 ක් වියදම් දරා තිබුණි. ඒ අනුව 2017 වර්ෂයට පෙර දරන ලද මුළු වියදම වූ රු.4,639,631 නිශ්කාර්ය වියදම් වී තිබුණි. | නවීකරණය කිරීම හේතුවෙන් නැවත අළුත්වැඩියා කිරීමට සිදුවිය. | ගොඩනැගිලි නවීකරණ කටයුතු දී කාලීනව පවතින පරිදි සැලසුම් ක අදාළ කටයුතු කිරීමට කළමනාකරණ වගබලා ගත යුතුය. මෙවැනි අනාර්ථි වැය කිරීම් පිළිබඳව වගකිව යු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාකළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් 23 හා 2018 මැයි 15 දින ආයතනයේ තනතුරු 33 ක් සඳහා කාර්යය මණ්ඩලය 454 ක් අනුමත කර තිබුණද, ආයතනයේ ප්‍රධාන තනතුරු 10 ක් සඳහා 2019 පෙබරවාරි වන විටත්, බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. එමෙන්ම 2018 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ස්ථිර වෛද්‍ය නිලධාරීන් 9 දෙනෙකු හා | ඉදිරියේදී බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු සිදුකරමින් පවතී. | ප්‍රධාන තනතුරු වලට අදාල බඳවා ගැනීම් නොපමාව සිදුකිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් පදනම යටතේ වෛද්‍ය නිලධාරින් 28ක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව වෛද්‍ය නිලධාරින් 34ක් පුරප්පාඩුව පැවතුන අතර, එම පුරප්පාඩු සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ නියැදි විගණන පරීක්ෂාවේදී දෛනික පැය පදනම යටතේ රාජකාරි සඳහා බඳවාගෙන ඇති වෛද්‍ය නිලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට වෛද්‍යවරු 11 දෙනෙකු රාජකාරි කටයුතු සඳහා වාර්තා කර නොතිබුණු අතර, එසේ සේවයට වාර්තා නොකල වෛද්‍යවරු සම්බන්ධයෙන් මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දැනුවත් කර ඔවුන් හට වෛද්‍ය සහතික නිකුත් කිරීම අවහිර වන පරිදි කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් පවතී | ආයතනයේ ප්‍රධාන කාර්යසාධනය ඉටු කිරීමට දායකත්වය සපයනුයේ වෛද්‍ය නිලධාරින් වන බැවින්ද,එම තනතුරු පුරප්පාඩු වීම ආයතනයේ කාර්යසාධනයට සෘජුවම බලපාන බැවින්ද පුරප්පාඩු සපුරා ගැනීමට ප්‍රමුඛත්වය ලබාදී කටයුතු කළ යුතුවීම |

**4.** **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**
-----------------------------------------

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම්** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක: පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය සඳහා ඉදිරිපත් කල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාසයක් ප්‍රමාද වී 2019 අප්‍රේල් 09 දිනදීය. | අදහස් දක්වා නොතිබුණි. | නියමිත කාල සීමාව තුල ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් අරමුණු වලට අදාල වන සේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි ලබාගැනීම, වෛද්‍ය උපකරණ ලබා ගැනීම, වඩාත් තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරිම සඳහා පුහුණු වැඩමුලු දියත් කිරිම ආදිය අරමුණුවලට අදාල වනසේ ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇති බව | ආයතනය ඉටු කිරීමට සැලසුම් කරන කටයුතුවලට අනුකූලවන පරිදි ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |